# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 01

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

APRIL 10, 2011 අප්‍රියෙල් මාසය (බුද්ධ වර්ෂ 2554 බක් මාසය) http://www.lankaheritage.com/lankaviththi/





ලෝක කුසලාන තිබු අප අත රැඳිලා
රෑ ක දුටු සිහිනයක් සේ ගියෙ බිඳිලා
සෝක වුනත් පුත නුඹ අප හිත රිදිලා
ඒ ක බිඳක්වත් නැත උන්හට දැනිලා

**The precious Cup that was almost in our hands**
**Just slipped away turning all to a shattered dream**
**I truly understand how sad you feel, broken and low**
**But will they ? no my son, I don't think so !**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# ඔබ සැමට සුබ සිංහල අළුත් අවුරුද්දක් වේවා !



# දුක් ගැහැට අමතකවන බක් මාසය

♦ **සංජය විමලරත්න**

අප්‍රේල් වන මේ මාසය බක් නම් සිංහළ අවුරුදු මාසය ලෙස හැඳින්වෙයි. දුක් ගැහැට අමතක වන මාසය යයි ඉහත මා සඳහන් කළේ ශ්‍රීලංකාවේ ජනතාවට කුමන දුකක් විඳින කලක වුවද ඒ දුක් අමතක කර කිසි දුකක් නැත්තා සේ සිනාමුසු මුහුණින් සිය ජාතික අවුරුදු දිනයට මුහුණ දෙන පුරුද්දක් ස්වභාව යෙන්ම ඇති බැවිනි. මේ ගතිය කොටි ත්‍රස්තවාදයෙන් පීඩිතව සිටි පසුගිය තිස් වසර පුරාම අපේ ජනතාව ඒ දුක්ඛ දෝමනස්ස තුළ සිටිමින් ද අඛණ්ඩව අවුරුදු සිරිත් විරිත් ඉටු කළ හැටි අපි දුටුවෙමු. සිංහළ අවුරුද්දේ ආනුභාවය හා ආශ්චර්යය එවැනි ය.

## පළාත්පාලන ඡන්දය සහ ක්‍රිකට් ශූරතාව

පසුගිය මාර්තු මාසයේ ශ්‍රීලංකාවේත් ලෝකයේ විවිධ රටවලත් බොහෝ සැලකිය යුතු සිදුවීම් වීය. ශ්‍රීලංකාවේ දින දින නැග ආ බඩුමිළ ගැන වූ උද්ඝෝෂණ හා මහජන විරෝධතා මඳක් යට යන කාරණා වූයේ මාර්තු පැවති පළාත් පාලන මැතිවරණය හා ක්‍රිකට් ලෝක ශූරතාවයි. ශ්‍රීලංකාව ද ඉන්දියාව සහ බංගලාදේශය සමග එකතුව එම තරඟමාලාවේ සත්කාරක රටක් ලෙස ඉදිරිපත්ව සිටියා ය. ක්‍රිකට් උන්මාදය ඇතිකර රටේ දැවෙන ප්‍රශ්න රජය ජනතාවට අමතක කරන්නට සලස්වනවායයි විපක්ෂය නැගූ එක් චෝදනාවකි. අනෙක් චෝදනාව නම් රජය බඩුමිළ වැඩිකිරීම ප්‍රමාද කරන් නේ එසේ කළහොත් ඔවුන් පළාත් පාලන ඡන්දය පරදින නිසා බවත් ඡන්දයෙන් පසු නිසැකවම බඩු මිළ තිබුණාටත් වඩා දෙතුන් ගුණයකින් වැඩිකරාවිය යන බවත්ය. ඒ කාරණා දෙකම සම්පූර්ණයෙන්ම වැරදියයි කියන්නටද බැරිය. එහෙත් එක් සැබෑ කරුණක් නම් රජය එසේ කළත් නොකළත් කවදත් ක්‍රිකට් ලෝලී අපේ ජනතාව ඒ කාල සීමාව තුළ මුළුමනින්ම ක්‍රිකට් උණ වැළඳී සිටි බව නම් සැබෑය.

මාර්තු **17** වන දින පැවති පළාත්පාලන ඡන්දයෙන් රජයට අවාසි වන්නේයයි විපක්ෂය කී අනාවැකි බොරු කරමින් එක්සත් ජනතා නිදහස් සංධාන රජයට විශාල ජයග්‍රහණයක් හිමිවීය. ඡන්දය පැවැති ප්‍රා:සභා **234** කි.

| | | | |
|---|---|---|---|
| එක්සත් ජනතා නිදහස් සංධානය | සභා | - | **205** |
| දෙමළ ජාතික සංධානයට **TNA** | සභා | - | **12** |
| එක්සත් ජාතික පක්ෂය **UNP** | සභා | - | **9** |
| මුස්ලිම් කොන්ග්‍රසය **Muslim Congress** | | - | **4** |
| මුස්ලිම් ජාතික කොන්ග්‍රසය **MNC** | සභා | - | **2** |
| කඳුරට පෙරමුණ **Upcountry Front** | | - | **1** |
| ස්වාධීන **Independent** | සභා | - | **1** |

මෙම පළාත් පාලන මැතිවරණයේදී කැපී පෙනුණු කාරණයක් වූයේ බොහෝ අපේක්ෂකයන් ඉදිරිපත් කර තිබූ ජනතා විමුක්ති පෙරමුණට එකද පළාත් සභාවකවත් බලය හිමි නොවීමයි. එපමණක් ද නොව කලින් ඔවුන් සතුව තිබූ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බලය ද මෙවර ඔවුන්ට නැතිව ගිය අතර එය ලැබුණේ නිදහස් සන්ධාන රජයට ය.

නොයෙක් අක්‍රමිකතා සහ දුර්වලකම් නිසා මෙවර නාම යෝජනා පත්‍ර රාශියක් ප්‍රතික්ෂේපවී ඇත. නාම යෝජනා පත්‍රයක් හරිහැටි පුරවන්නට නොදන්නා අය මොකට ඡන්දෙ ඉල්ලනවාදැයි ඇසිය යුතු ප්‍රශ්නයකි.


**4 වන පිටුවට** →




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරි,
සුබ නව වසරක් වේවා!
FAST CASH
SEND TODAY - COLLECT TODAY



විස්තර පිටු අංක 3